# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2122/16 - 2019 මැයි මස 07 වැනි අඟහරුවාදා - 2019.05.07**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2011 අංක 18 දරන වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනත**

3 වැනි වගන්තිය යටතේ නියෝගය

2011 අංක 18 දරන වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනතේ 3 වන වගන්තියේ (3) වන උප වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, *වැඩබලන මුදල් අමාත්‍ය එරාන් වික්‍රමරත්න*, වන මම 2019 මැයි මස 07 වන දින සිට බලපැවැත්වෙන පරිදි, මෙම නියෝගය මගින්, 2017 දෙසැම්බර් මස 13 දිනැති 2049/16 දරන *අති විශෙෂ ගැසට් නිවේදනයේ* II වන උපලේඛනය, එකී උපලේඛනයට මෙහි උපලේඛනයේ I හා II තීරු වල සඳහන් සංයෝජිත වර්ගීකරණ සංකේතාංක යටතේ ඊට අනුරූපව III වැනි තීරුවේ සඳහන් වූ විස්තර යටතේ නිශ්චිතව දක්වා ඇති අයිතමයන් එකතු කිරීමෙන් සංශෝධනය කරමි.

එරාන් වික්‍රමරත්න,
මුදල් අමාත්‍ය (වැ.බ.).

2019 මැයි මස 07 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

**උපලේඛනය**

| *I*<br>*සං.ව. ශීර්ෂය* | *II*<br>*සංයෝගීකරණ වර්ගීකරණ සංකේතය* | *III*<br>*විස්තරය* | *IV*<br>*නිදහස්* |
|---|---|---|---|
| **85.43** | | **මෙම පරිච්ඡේදයේ අන් තැනක නිශ්චිත නොවූ හෝ ඇතුළත් නොවූ, තනි කාර්යයන් සහිත විද්‍යුත් යන්ත්‍ර සහ උපකරණ.** | |
| | 8543.70.90 | අනෙකුත් | නිදහස් |
| | | | |
| **90.22** | | **වෛද්‍ය, ශල්‍ය, දන්ත වෛද්‍ය හෝ පශු වෛද්‍ය කටයුතු සඳහා වූ හෝ නොවූ, රේඩියෝග්‍රැෆි හෝ රේඩියෝ චිකිත්සා උපකරණ කට්ටල, එක්ස් කිරණ නළ සහ අනෙකුත් එක්ස් කිරණ ජනක යන්ත්‍ර, අධිබල ජනක යන්ත්‍ර, පාලන පුවරු සහ ඩෙස්, තිර, පරීක්ෂා කිරීමේ හෝ ප්‍රතිකාර කිරීමේ මේස, පුටු සහ සමාන දේ ඇතුළුව, එක්ස් කිරණ හෝ ඇල්පා, බීටා හෝ ගැමා විකිරණ මත පදනම් වූ උපකරණ කට්ටල.** | |

1A - PG 4513 — 567 (2019/05)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

උපලේඛනය (සම්බන්ධිතයි)

| *I* <br> *සං.ව. ශීර්ෂය* | *II* <br> *සංයෝගීකරණ වර්ගීකරණ සංකේතය* | *III* <br> *විස්තරය* | *IV* <br> *නිදහස්* |
|---|---|---|---|
| | | **වෛද්‍ය, ශල්‍ය, දන්ත වෛද්‍ය හෝ පශු වෛද්‍ය කටයුතු සඳහා වූ හෝ නොවූ, රේඩියෝග්‍රැපි හෝ රේඩියෝ චිකිත්සා උපයෝගී උපකරණ කට්ටල ඇතුළුව, එක්ස්රේ කිරණ මත පදනම් වූ උපකරණ කට්ටල :** | |
| | 9022.19.00 | අනෙකුත් කටයුතු සඳහා | නිදහස් |
| | | | |
| **90.31** | | **මෙම පරිච්ඡේදයේ අන් තැනක නිශ්චිත නොවූ හෝ ඇතුළත් නොවූ, මැනීමේ හෝ පරීක්ෂා කිරීමේ මෙවලම්, උපයෝගී උපකරණ සහ යන්ත්‍ර ; ප්‍රොෆයිල්ප්‍රොජෙක්ටර්.** | |
| | 9031.80.00 | අනෙකුත් මෙවලම්, උපයෝගී උපකරණ සහ යන්ත්‍ර | නිදහස් |

05 - 608

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.